# යාපහු රාජධානිය සීගිරියට දක්වන සමානත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (යාපහුවේ ශේෂ ව පවතින ගෘහ නිර්මාණ හා නගර සැලසුම් ස්මාරක ඇසුරෙන්)

**බණ්ඩාරවත්ත බී.ජී.ඒ.එච්,[1] ද සිල්වා ඩබ්ලියු.එස්.ඒ.[2]**

යාපහුව රාජධානිය පිළිබඳ මුල් ම ලිඛිත සාධක හමුවන්නේ 13 වන සියවසේ දී ය. එනම් සුභ නැමැති සෙනවියා විසින් බලකොටුවක් ගොඩනගා එහි වාසය කළ බව වංශකතා සාහිත්‍යය ප්‍රකාශ කිරීම මඟින් ය. පසුව ක්‍රි.ව 1271 දී පළමුවැනි බුවනෙකබාහු රජු දඹදෙණියේ රජ බවට පත්වූවත් විවිධ දිශාවලින් එල්ල වූ අභියෝග නිසා සතුරාගෙන් මිදීමට ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙස පැවති යාපහුවට පලා ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයෙන් බිහි වූ දෙවැනි රාජධානිය ලෙස යාපහුව රාජධානිය නිර්මාණය විය. මෙලෙස නිර්මාණය වූ යාපහුව රාජධානිය තුළ ශේෂ ව පවතින ස්මාරක ආශ්‍රයෙන්, යාපහුව රාජධානිය සීගිරියට දක්වන සමානත්වය කෙබඳු ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම අධ්‍යයන ගැටලුව වේ. අධ්‍යයනයේ මූලික අරමුණ වශයෙන් අනුරාධපුර යුගයේ නිර්මිත ලෝක උරුමයක් ලෙස සැලකෙන සීගිරි බලකොටුවට බොහෝමයක් කරුණු අතින් සමානත්වයක් දක්වන යාපහුව රාජධානිය, එහි පවතින නගර සැලසුම් සහ ගෘහ නිර්මාණ ශිල්පයන් හා කලා නිර්මාණ ආශ්‍රයෙන් ඉතා වැදගත් ස්ථානයක් ලංකා ඉතිහාසයයේ උරුමවන බව පෙන්වාදීම මූලික අරමුණ ලෙස පෙන්වා දිය හැකි ය. අධ්‍යයන ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් යාපහුව කලා නිර්මාණ පවතින ක්ෂේත්‍රය අධ්‍යයනයට ලක් විය. හඳුනාගැනීම් තුළ යාපහුව රාජධානිය සීගිරියට දක්වන සමානත්වය, වත්මනෙහි යාපහුව තුළ ශේෂ ව පවතින ස්මාරක ආශ්‍රයෙන් පරික්ෂා කිරීම තුළ, යාපහුවේ ශේෂ ව පවතින නගර සැලසුම් හා සීගිරිය අතර ඇති සමානත්වය හා යාපහුවේ ශේෂ ව පවතින ගෘහ නිර්මාණ හා සීගිරිය අතර පවතින සමානත්වය යන අංශ දෙක යටතේ යාපහුව සීගිරියට දක්වන සමානත්වය මෙහි දී හඳුනාගත හැකි ය. යාපහුව තුළ ශේෂ ව පවතින නගර සැලසුම් නිර්මාණ ශිල්පයේ දී සීගිරියට දක්වන සමානත්වය විමසීමේ දී ස්වාභාවික ආරක්ෂාව, පිට නගරය, පිට දිය අගල, පිට ප්‍රාකාරය, ඇතුල් නගරය, ඇතුල් අගල හා පවුර පදනම් කරගනිමින් සීගිරියට දක්වන සමානත්වය ද යාපහුවේ ශේෂ ව පවතින ගෘහ නිර්මාණ ශිල්පය ඇසුරින් සීගිරියට දක්වන සමානත්වය සලකා බැලීමේ දී ද්වාර මණ්ඩපය සහිත විසිතුරු පියගැටපෙළ, සභා ශාලාව, සිංහ මූර්ති යුගලයත් ආශ්‍රයෙන් මෙන් ම යාපහුව හා සීගිරිය බොහෝ ලක්ෂණ අතින් සමාන වීමට පදනම් වන ලක්ෂණ අතර, සීගිරිය මෙන් ම යාපහුවේ භෞතික පිහිටීම, මෙම ද්විත්වයන් ම බලකොටු නගර වීම සහ රාජ්‍ය ආරක්ෂාව යන හේතු සාධක මූලික කරගෙන යාපහුව නිර්මාණය වීම හේතුවෙන් යාපහුව තුළ සීගිරියට සමාන ලක්ෂණ ගොඩනැගී ඇති බව මෙම කරුණු අනුව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** යාපහුව රාජධානිය, සීගිරි බලකොටුව, ස්මාරක, ගෘහ නිර්මාණ ශිල්පය, නගර සැලසුම්

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ayeshabandarawaththa244@gmail.com